# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## ගල්හින්න ජාමිඅතුල් ෆත්තාහ් අරාබි විදුහල
## (සංස්ථාගත කිරීමේ)

**ගල්හින්න ජාමිඅතුල් ෆත්තාහ් අරාබි විදුහල සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.**

---

ත්‍රිකුණාමලය දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ඉම්රාන් මහරූෆ් මහතා විසින්
2016 ඔක්තෝබර් මස 26 වන දින ඉදිරිපත් කරන ලදී.

(ගැසට් පත්‍රයේ පළ කළේ 2016 ඔක්තෝබර් මස 10 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී.

---

[147 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිළ : රු. 8.00 යි** **තැපැල් ගාස්තුව : රු. 10.00 යි.**

## ගල්හින්න ජාමිඅතුල් ෆත්තාහ් ආරාබි විදුහල (සංස්ථාගත කිරීමේ)

### ගල්හින්න ජාමිඅතුල් ෆත්තාහ් අරාබි විදුහල සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.

පූර්විකාව.

''ගල්හින්න ජාමිඅතුල් ෆත්තාහ් අරාබි විදුහල'' යනුවෙන් සඳහන් කරනු ලබන හා සඳහන් කරනු ලබන අරාබි විදුහලක් එකී පදනමේ සාමාජිකයන් එකඟ වූ රීතිවලට අනුව එකී අරාබි විදුහල සම්බන්ධ සියලු කරුණු ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීමේ හා කරගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් පිහිටුවා තිබූ හෙයින් ද :

එකී අරාබි විදුහල පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කාරණා ද ඒ පරමාර්ථ සහ කාරණා මෙතෙක් කල් එකී අරාබි විදුහල විසින් සාර්ථක ලෙස ක්‍රියාත්මක කර සහ ඉටු කර ඇති හෙයින් ද එකී පදනම සංස්ථාගත කරන ලෙස ඉල්ලා ඇති බැවින් ද ඒ ඉල්ලීම ඉටු කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය.

**1.** මේ පනත 2016 අංක දරන ගල්හින්න ජාමිඅතුල් ෆත්තාහ් අරාබි විදුහල (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ගල්හින්න ජාමිඅතුල් ෆත්තාහ් අරාබි විදුහල සංස්ථාගත කිරීම.

**2.** මෙම පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ ඉන් පසුව (මෙහි මින් මතු ''අරාබි විදුහල'' යනුවෙන් සඳහන් කරනු ලබන) ගල්හින්න ජාමිඅතුල් ෆත්තාහ් අරාබි විදුහලේ දැනට සාමාජිකයන්ව සිටින තැනැත්තන් සහ මෙයින් පිහිටුවනු ලබන සංස්ථාවට සාමාජිකයන් වශයෙන් මින් මතු අතුළත් කරනු ලබන තැනැත්තන් (මෙහි මින් මතු ''සංස්ථාව'' යනුවෙන් හඳුන්වනු ලබන) ගල්හින්න ජාමිඅතුල් ෆත්තාහ් අරාබි විදුහල යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු අතර, ඒ නාමයෙන් ඒ සංස්ථාව විසින් ද, ඊට විරුද්ධව ද නඩු පවරනු ලැබිය හැකි ය. තවද පොදු මුද්‍රාවක් තබා ගැනීමේ ද, එය පාවිච්චි කිරීමේ ද, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය හා අධිකාරය ඊට ඇත්තේ ය.

සංස්ථාවේ පොදු පරමාර්ථ.

**3.** සංස්ථාව පිහිටුවනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද, ඒ පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:—

(අ) ශුද්ධ වූ කුරානය මතකයේ තබා ගැනීම සඳහා ශිෂ්‍යයන් පුහුණු කිරීමේ පන්ති පැවැත්වීම;

(ආ) ඉස්ලාමීය ආගමික අධ්‍යාපනය ආරාබි භාෂා මාධ්‍යයෙන් ලබාදීම;

(ඇ) ඉස්ලාම් ධර්මය ප්‍රයෝගික ලෙස පිළිපැදීමට ධෛර්ය ලබාදීම;

(ඈ) මුස්ලිම්වරුන් සහ වෙනත් ආගම් අදහන තැනැත්තන්ට ඉස්ලාම් ධර්මය පිළිබඳව මනා අවබෝධයක් ලබාදීම සඳහා සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවෙන් යුත් පොත් වාර සඟරා ආදිය ප්‍රකාශයට පත් කිරීම සහ අංග සම්පූර්ණ පුස්තකාල ස්ථාපනය කිරීම;

(ඉ) ඉස්ලාමීය ධර්මය අනෙකුත් භාෂාවලින් ප්‍රචාරය කිරීමට ඉවහල් වනු පිණිස ශිෂ්‍යයන්ට අනෙකුත් භාෂා ඉගැන්වීම;

(ඊ) මුස්ලිම් ජනයා අතර එකමුතු බව ඇති කිරීම හා වර්ධනය කිරීම සහ ඔවුන් මුහුණ පා ඇති ගැටළුවලට විසඳුම් සෙවීමටත් ආගමික කටයුතු වලදී අවශ්‍යනම් ''ෆත්වා'' ලබා දීම;

(උ) සුදුසුකම් ඇති සිසුන්ට විදේශයන් හි අධ්‍යාපනය ලැබීමට සහයෝගය දීම සහ ශිෂ්‍යත් ව ලබා දීම; සහ

(ඌ) ඉහත සඳහන් පරමාර්ථ සාක්ෂාත් කර ගැනීම සඳහා ආනුෂංගික වන්නා වූ හෝ හිතකර වන්නා වූ වෙනත් සියලු දේ කිරීම.

**4.** අරාබි විදුහලේ ගරු විදුහල්පති, ගුරුවරුන්, ශිෂ්‍යයන් හා ගෞරවනීය භාරකරුවන් සහ සේවකයින් සෑම අවස්ථාවක දීම ''අහ්ලුස් සුන්නත්වල්ජමාඅත්'' කණ්ඩායමට අයත්විය යුතු අතර, ඔවුන් ''අශ් - අරියා'' සංග්‍රහය ''ශාෆි මද්හබ්'' මග පෙන්වීම සහ ''තසව්වුෆ්'' ක්‍රියාමාර්ගය අනුගමනය කළ යුතු අතරම ශුද්ධ වූ ''තබ්ලීග් ජමාඅත්'' නම් ප්‍රචාරණයට සහය විය යුතු අතර හැකිනම් එම ව්‍යාපාරයට ධෛර්ය දිය යුතු ය. සංස්ථාවේ විශ්වාස සංග්‍රහය.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

**5.** (1) සංස්ථාවේ කටයුතු, කළමනාකරණය කිරීම පාලනය කිරීම සහ පරිපාලනය කිරීම, සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවල විධිවිධාන සලස්වා තිබෙන නිලධරයන්ගෙන් හා වෙනත් තැනැත්තන්ගෙන් සමන්විත වූ (මෙහි මින්මතු “සභාව” යනුවෙන් සඳහන් කරනු ලබන) භාරකාර සභාවක් වෙත මේ පනතේ විධිවිධානවලට තත්කාලයේ බලපවත්නා රීතිවලට යටත් ව පැවරෙන්නේ ය.

(2) මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේ දී අරාබි විදුහලේ භාරකාර සභාවේ සාමාජිකයන් වශයෙන් ධුර දැරුවා වූ සාමාජිකයන් සංස්ථාවේ ප්‍රථම සභාවේ සාමාජිකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

**6.** මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත් ව බැංකු ගිණුම් විවෘත කිරීමේ, පවත්වාගෙන යාමේ සහ වැසීමේ ද ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීමේ හෝ ලබා ගැනීමේ ද, ප්‍රදාන හෝ පරිත්‍යාග භාර ගැනීමේ ද හෝ එකතු කිරීමේ ද ස්වකීය අරමුදල් ආයෝජනය කිරීමේ ද සංස්ථාව විසින් දරනු ලබන යම් ඉඩමක යම් ගොඩනැගිල්ලක් හෝ නිර්මාණයන් ඉදි කිරීමේ ද සංස්ථාවේ පරමාර්ථ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය නිලධරයන් සහ සේවකයන් සේවයට ගැනීමේ සේවයෙහි නියුක්ත කිරීමේ සහ සේවයෙන් පහ කිරීමේ ද බලය ඇතුළුව සංස්ථාවේ පරමාර්ථ වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය කවර වූ හෝ සියලු ක්‍රියා කාරණා සහ දේ ඉටු කිරීමේ සහ ක්‍රියාත්මක කිරීමේ බලය සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ රීති.

**7.** (1) සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, ඔවුන්ගේ ඉල්ලා අස්වීම හෝ ඔවුන් නෙරපීම සඳහා ද භාරකාර මණ්ඩලය තෝරා පත්කරගැනීම සඳහා සංස්ථාවේ නිලධරයන්ගේ, අනුයෝජිතයන්ගේ සහ සේවකයන්ගේ කාර්ය කරගෙන යාමේ දී අනුගමනය කළයුතු කාර්ය පටිපාටිය සඳහා ද, සාමාන්‍යයෙන් සංස්ථාවේ සහ භාරකාර මණ්ඩලයේ කටයුතු කරගෙන යාම සඳහා සහ සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ එහි පරමාර්ථ මුදුන්පත් කර ගැනීම සඳහා ද, සංස්ථාව විසින් කලින් කල යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන් මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක

විධිවිධානවලට අනනුකූල නොවන රීති සෑදීම නීත්‍යනුකූල වන්නේ ය. එකී රීති සෑදීමෙන් පසු එවැනිම රැස්වීමක දී එවැනිම ආකාරයකින් ඒවා වෙනස් කිරීම ඊට යමක් එකතු කිරීම ඒවා සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම කළ හැකි ය. :—

(2) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

**8.** (1) සංස්ථාවට එහිම අරමුදලක් තිබිය යුතු ය. ත්‍යාග, රික්තවරණ, පරිත්‍යාග, පැවරුම්, ග්‍රාහක මුදල්, දායක මුදල්, හෝ ගාස්තු භාරකාර මණ්ඩලය විසින් තීරණය කරනු ලබන පරිදි, එක් බැංකුවක හෝ බැංකු වැඩි ගණනාවක සංස්ථාවේ බැරට තැන්පත් කරනු ලැබිය යුතු ය. සංස්ථාවේ අරමුදල.

(2) සංස්ථාවේ පරමාර්ථ ක්‍රියාත්මක කරගෙන යාමේ දී සංස්ථාව විසින් දරන ලද යම් වියදමක් පියවීමට අවශ්‍ය සියලු මුදල් සංස්ථාවේ අරමුදලින් ගෙවනු ලැබිය හැකි ය.

(3) සංස්ථාවේ මුදල් සහ දේපල කවර ස්ථානයකින් උපලබ්ධි වුවද, මෙහි දක්වා ඇති පරිදි, සංස්ථාවේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීම උදෙසා පමණක්ම යොදවනු ලැබිය යුතු අතර, ලාභාංශයක්, ප්‍රසාද දීමනාවක් හෝ අන් කවර හෝ ලාබයක් වශයෙන් සංස්ථාවේ මුදල් සහ දේපල වලින් කිසිම කොටසක් සංස්ථාවේ සාමාජිකයන්ට කෙලින්ම හෝ අන්‍යාකාරයෙන් ගෙවීම හෝ පැවරීම කරනු නොලැබිය යුතු ය.

එසේ වුවද, මේ වගන්තියේ විධිවිධාන මගින්-

(අ) සංස්ථාවේ යම් නිලධරයකු හෝ සේවකයකු විසින් සංස්ථාවට කරන ලද යම් සේවාවක් වෙනුවෙන් සද්භාවයෙන් යම් සාධාරණ සහ නිසි පාරිශ්‍රමිකයක් ඔහුට ගෙවීම ;

(ආ) සංස්ථාවේ යම් සාමාජිකයකු විසින් හෝ සංස්ථාවේ සාමාජිකයකු යම් සමාගමක කොටස්කරුවකු වන අවස්ථාවක ඒ සමාගම විසින් සංස්ථාවට කුලියට දෙන ලද ස්ථානයක් සඳහා සාධරණ නිසි කුලියක් ගෙවීම ; සහ

(ඈ) තම කටයුතු හෝ කාර්ය ඉටු කිරීමෙහි ලා හෝ සංස්ථාවේ පරමාර්ථ නංවාලීමෙ හි ලා සංස්ථාවේ යම් සාමාජිකයකු නිලධරයකු හෝ සේවකයකු විසින් භාරකාර සභාව කලින් ලබා ගන්නා ලද අනුමැතිය ඇති ව දරන ලද යුක්තිසහගත හා නිසි වියදම් ආපසු ගෙවීම පියවීම.

සංස්ථාවේ ගිණුම් හා විගණනය.

**9.** (1) සංස්ථාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(2) සංස්ථාව විසින් එහි ආදායම හා වියදම, වත්කම් සහ බැරකම් සහ සංස්ථාවේ වෙනත් සියලු ගණුදෙනු පිළිබඳ නිසි ගිණුම් තබා ගැනීමට කටයුතු සැලැස්විය යුතු ය.

(3) සංස්ථාවේ ගිණුම් සභාව තීරණය කරන පරිදි සුදුසුකම් ලත් විගනකවරයකු විසින් විගණනය කරනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තියේ "සුදුසුකම්ලත් විගණකවරයා" යන්නෙන් :—

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද, ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද තැනැත්තෙක් ; හෝ

(ආ) ගණකාධිකාරී ආයතනයක එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු ව වන්නා වූ ද, ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියේ යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද, එවැනි වරලත් ගණකාධිකාරී ආයතනයක්,

අදහස් වේ.

අභිධාන පාවිච්චි කිරීමේ සුදුසුකම්.

**10.** (1) "අල් ආලිම්" ලෙස මෙම විදුහලෙන් සමත් වන සෑම සිසුවෙකුටම "ෆත්තාහි" යන අභිධානය ලබා ගැනීමේ සහ භාවිතා කිරීමේ ද තම නාමයට පසුව පාවිච්චි කිරීමේ ද හිමිකම ඇත්තේ ය.

(2) ඉහත සඳහන් පරිදි හැර යට කී අභිධානයක් හෝ යෙදුමක් කිසිදු කාර්යයක් සඳහා වුව ද කිසිදු තැනැත්තකු විසින් පාවිච්චි නොකළ යුතු ය.

සාමාජිකයන්ගේ වගකීම සීමා කිරීම.

**11.** සංස්ථාවේ කිසිම සාමාජිකයකු ඔහුගෙන් සංස්ථාවට අය විය යුතු වාර්ෂික දායක මුදල් ප්‍රමාණය ඉක්වමන යම් මුදලක් සංස්ථාවේ ණය සහ බැරකම් නිදහස් කිරීමේ කාර්යය සඳහා හෝ වෙනත් යම් කාර්යයක් සඳහා ගෙවීමට යටත් නොවි යුතු ය.

විදුහල විසින් සහ විදුහලට ගෙවිය යුතු මුදල්.

**12.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයෙහි විදුහලේ පැවැති සියලු ණය සහ බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලැබූ සංස්ථාව විසින් ගෙවා නිදහස් කළ යුතු අතර, එදිනට විදුහලට ගෙවිය යුතු ග්‍රාහක මුදල් සහ දායක මුදල් මේ පනතේ කාර්ය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාව විසින් චංචල සහ නිශ්චල දේපළ දැරිය හැකි බව.

**13.** යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, තෑගි කිරීමක්, අන්තිම කැමති පත්‍රයකින් දේපල බැහැර කිරීමක් ප්‍රකාර හෝ වෙනත් ආකාරයකින් සංස්ථාව සතුවන යම් චංචල හෝ නිශ්චල දේපලක් ගැනීමට සහ දැරීමට නීතියෙන් සංස්ථාවට බලය හා හැකියාව ඇති අතර, එවැනි සියලු දේපල සංස්ථාවේ තත්කාලීනව බලපවත්නා රීතිවලට යටත්ව, මේ පනතේ කාර්ය සඳහා ඒ දේපල විකිණීමේ, උකස් කිරීමේ, බදුදීමේ, හුවමාරු කිරීමේ හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමේ පූර්ණ බලය ඇතිව, මේ කාර්ය සඳහා සංස්ථා, විසින් දැරිය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව.

**14.** ලේකම්වරයා හෝ සභාව විසින් යථා පරිදි බලය දෙනු ලැබූ සභාවේ සාමාජිකයකු හා සභාවේ තවත් සාමාජිකයකු ඉදිරිපිට දී හැර සංස්ථාවේ මුද්‍රාව කවර වුව ද සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් ඔවුන් විසින් ඒ සාධන පත්‍රයෙහි තම නම අත්සන් කළ යුතු ය. තව ද, එම අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු විසින් කරනු ලැබූ අත්සනකට පරිබාහිර විය යුතු ය.

සාමාජික නාමලේඛනය.

**15.** (1) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී කමිටුවේ සාමාජිකයකු වූ සෑම තැනැත්තකුගේ ම සහ ඉන් පසුව සංස්ථාවේ සාමාජිකයකු වශයෙන් යථා පරිදි ඇතුළත් කරගනු ලබන සෑම තැනැත්තකුගේ ම නම ඇතුළත් කළ යුතු සාමාජික නාම ලේඛනයක් පවත්වාගෙන යාමට මණ්ඩලය විසින් කටයුතු කළ යුතු ය.

(2) ලේඛනයේ පහත සඳහන් විස්තර ඇතුළත් විය යුතු ය :—

(අ) සංස්ථාවේ එක් එක් සාමාජිකයාගේ, නම, ලිපිනය සහ රැකියාව ;

(ආ) යම් සාමාජිකයකුගේ නම ලේඛනයේ සටහන් කරනු ලැබූ දිනය ;

(ඇ) යම් තැනැත්තකු සාමාජිකයකු වී සිටීම අවසන් වූ දිනය ;

*විසුරුවා හැරීමේ දී ඉතිරිවන දේපල.*

**16**. සංස්ථාව විසුරුවා හැරීමේ දී, එහි සියලු ණය සහ බැරකම් ගෙවා සමථයට පත් කිරීමෙන් පසු කවර හෝ යම් දේපලක් ඉතිරි වුවහොත්, ඒ දේපල සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදා දෙනු නොලැබිය යුතු අතර, සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද ස්වකීය රීති අනුව යම් ආදායමක් හෝ දේපලක් ස්වකීය සාමාජිකයන් අතර බෙදා දීම රීති මගින් තහනම් කර ඇත්තා වූ ද වෙනත් ආයතනයකට හෝ ආයතනවලට ඒ දේපල දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය. එම ආයතනය හෝ ආයතන කවරේ ද යන්න සංස්ථාව විසුරුවා හැරීමේ දී හෝ ඊට පෙර, සංස්ථාවේ සභාව විසින් තීරණය කළ යුතු ය.

*ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.*

**17.** මේ පනතෙහි සඳහන් තැනැත්තන් හා ඔවුන් මගින් ඔවුන්ගෙන් හෝ ඔවුන් යටතේ හිමිකම්පාන්නන් හැර ශ්‍රී ලංකා ජනරජයේ යම් රාජ්‍ය මණ්ඩලයක, සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තකුගේ අයිතිවාසිකම්වලට මේ පනතේ අඩංගු කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවන්නේ ය.

*සද්භාවයෙන් කරන ලද ක්‍රියා වගකීමෙන් නිදහස් කිරීම.*

**18**. මේ පනතේ හෝ ඒ යටතේ පවරනු ලැබූ බලතල ප්‍රකාර නැතහොත් මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමෙහි ලා යම් තැනැත්තකු විසින් සද්භාවයෙන් කරනු ලැබූ හෝ කරන ලදැයි සලකනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් නඩු පවරනු ලැබීමට හෝ වෙනත් නීති කෘත්‍යයකට ඒ තැනැත්තා යටත් නොවන්නේ ය.

*අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.*

**19.** මෙම පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.

## ගල්හින්න ජාමිඅතුල් ෆත්තාහ් ආරාබි විදුහල (සංස්ථාගත කිරීමේ)

### ගල්හින්න ජාමිඅතුල් ෆත්තාහ් අරාබි විදුහල සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.

පූර්විකාව.

“ගල්හින්න ජාමිඅතුල් ෆත්තාහ් අරාබි විදුහල” යනුවෙන් සඳහන් කරනු ලබන හා සඳහන් කරනු ලබන අරාබි විදුහලක් එකී පදනමේ සාමාජිකයන් එකඟ වූ රීතිවලට අනුව එකී අරාබි විදුහල සම්බන්ධ සියලු කරුණු ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීමේ හා කරගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් පිහිටුවා තිබූ හෙයින් ද :

එකී අරාබි විදුහල පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කාරණා ද ඒ පරමාර්ථ සහ කාරණා මෙතෙක් කල් එකී අරාබි විදුහල විසින් සාර්ථක ලෙස ක්‍රියාත්මක කර සහ ඉටු කර ඇති හෙයින් ද එකී පදනම සංස්ථාගත කරන ලෙස ඉල්ලා ඇති බැවින් ද ඒ ඉල්ලීම ඉටු කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය.

**1.** මේ පනත 2016 අංක දරන ගල්හින්න ජාමිඅතුල් ෆත්තාහ් අරාබි විදුහල (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ගල්හින්න ජාමිඅතුල් ෆත්තාහ් අරාබි විදුහල සංස්ථාගත කිරීම.

**2.** මෙම පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ ඉන් පසුව (මෙහි මින් මතු “අරාබි විදුහල” යනුවෙන් සඳහන් කරනු ලබන) ගල්හින්න ජාමිඅතුල් ෆත්තාහ් අරාබි විදුහලේ දැනට සාමාජිකයන්ව සිටින තැනැත්තන් සහ මෙයින් පිහිටුවනු ලබන සංස්ථාවට සාමාජිකයන් වශයෙන් මින් මතු අතුළත් කරනු ලබන තැනැත්තන් (මෙහි මින් මතු “සංස්ථාව” යනුවෙන් හඳුන්වනු ලබන) ගල්හින්න ජාමිඅතුල් ෆත්තාහ් අරාබි විදුහල යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු අතර, ඒ නාමයෙන් ඒ සංස්ථාව විසින් ද, ඊට විරුද්ධව ද නඩු පවරනු ලැබිය හැකි ය. තවද පොදු මුද්‍රාවක් තබා ගැනීමේ ද, එය පාවිච්චි කිරීමේ ද, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය හා අධිකාරය ඊට ඇත්තේ ය.

සංස්ථාවේ පොදු පරමාර්ථ.

**3.** සංස්ථාව පිහිටුවනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද, ඒ පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:—

(අ) ශුද්ධ වූ කුරානය මතකයේ තබා ගැනීම සඳහා ශිෂ්‍යයන් පුහුණු කිරීමේ පන්ති පැවැත්වීම;

(ආ) ඉස්ලාමීය ආගමික අධ්‍යාපනය ආරාබි භාෂා මාධ්‍යයෙන් ලබාදීම;

(ඇ) ඉස්ලාම් ධර්මය ප්‍රයෝගික ලෙස පිළිපැදීමට ධෛර්ය ලබාදීම;

(ඈ) මුස්ලිම්වරුන් සහ වෙනත් ආගම් අදහන තැනැත්තන්ට ඉස්ලාම් ධර්මය පිළිබඳව මනා අවබෝධයක් ලබාදීම සඳහා සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවෙන් යුත් පොත් වාර සඟරා ආදිය ප්‍රකාශයට පත් කිරීම සහ අංග සම්පූර්ණ පුස්තකාල ස්ථාපනය කිරීම;

(ඉ) ඉස්ලාමීය ධර්මය අනෙකුත් භාෂාවලින් ප්‍රචාරය කිරීමට ඉවහල් වනු පිණිස ශිෂ්‍යයන්ට අනෙකුත් භාෂා ඉගැන්වීම;

(ඊ) මුස්ලිම් ජනයා අතර එකමුතු බව ඇති කිරීම හා වර්ධනය කිරීම සහ ඔවුන් මුහුණ පා ඇති ගැටළුවලට විසඳුම් සෙවීමටත් ආගමික කටයුතු වලදී අවශ්‍යනම් ''ෆත්වා'' ලබා දීම;

(උ) සුදුසුකම් ඇති සිසුන්ට විදේශයන් හි අධ්‍යාපනය ලැබීමට සහයෝගය දීම සහ ශිෂ්‍යත් ව ලබා දීම; සහ

(ඌ) ඉහත සඳහන් පරමාර්ථ සාක්ෂාත් කර ගැනීම සඳහා ආනුෂංගික වන්නා වූ හෝ හිතකර වන්නා වූ වෙනත් සියලු දේ කිරීම.

සංස්ථාවේ විශ්වාස සංග්‍රහය.

**4.** අරාබි විදුහලේ ගරු විදුහල්පති, ගුරුවරුන්, ශිෂ්‍යයන් හා ගෞරවනීය භාරකරුවන් සහ සේවකයින් සෑම අවස්ථාවක දීම ''අහ්ලුස් සුන්නත්වල්ජමාඅත්'' කණ්ඩායමට අයත්විය යුතු අතර, ඔවුන් ''අශ් - අරියා'' සංග්‍රහය ''ශාෆි මද්හබ්'' මග පෙන්වීම සහ ''තසව්වුෆ්'' ක්‍රියාමාර්ගය අනුගමනය කළ යුතු අතරම ශුද්ධ වූ ''තබ්ලීග් ජමාඅත්'' නම් ප්‍රචාරණයට සහය විය යුතු අතර හැකිනම් එම ව්‍යාපාරයට ධෛර්ය දිය යුතු ය.

**5.** (1) සංස්ථාවේ කටයුතු, කළමනාකරණය කිරීම පාලනය කිරීම සහ පරිපාලනය කිරීම, සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවල විධිවිධාන සලස්වා තිබෙන නිලධරයන්ගෙන් හා වෙනත් තැනැත්තන්ගෙන් සමන්විත වූ (මෙහි මින්මතු ''සභාව'' යනුවෙන් සඳහන් කරනු ලබන) භාරකාර සභාවක් වෙත මේ පනතේ විධිවිධානවලට තත්කාලයේ බලපවත්නා රීතිවලට යටත් ව පැවරෙන්නේ ය.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

(2) මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේ දී අරාබි විදුහලේ භාරකාර සභාවේ සාමාජිකයන් වශයෙන් ධුර දැරුවා වූ සාමාජිකයන් සංස්ථාවේ ප්‍රථම සභාවේ සාමාජිකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

**6.** මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත් ව බැංකු ගිණුම් විවෘත කිරීමේ, පවත්වාගෙන යාමේ සහ වැසීමේ ද ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීමේ හෝ ලබා ගැනීමේ ද, ප්‍රදාන හෝ පරිත්‍යාග භාර ගැනීමේ ද හෝ එකතු කිරීමේ ද ස්වකීය අරමුදල් ආයෝජනය කිරීමේ ද සංස්ථාව විසින් දරනු ලබන යම් ඉඩමක යම් ගොඩනැගිල්ලක් හෝ නිර්මාණයන් ඉදි කිරීමේ ද සංස්ථාවේ පරමාර්ථ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය නිලධරයන් සහ සේවකයන් සේවයට ගැනීමේ සේවයෙහි නියුක්ත කිරීමේ සහ සේවයෙන් පහ කිරීමේ ද බලය ඇතුළුව සංස්ථාවේ පරමාර්ථ වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය කවර වූ හෝ සියලු ක්‍රියා කාරණා සහ දේ ඉටු කිරීමේ සහ ක්‍රියාත්මක කිරීමේ බලය සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

**7.** (1) සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, ඔවුන්ගේ ඉල්ලා අස්වීම හෝ ඔවුන් නෙරපීම සඳහා ද භාරකාර මණ්ඩලය තෝරා පත්කරගැනීම සඳහා සංස්ථාවේ නිලධරයන්ගේ, අනුයෝජිතයන්ගේ සහ සේවකයන්ගේ කාර්ය කරගෙන යාමේ දී අනුගමනය කළයුතු කාර්ය පටිපාටිය සඳහා ද, සාමාන්‍යයෙන් සංස්ථාවේ සහ භාරකාර මණ්ඩලයේ කටයුතු කරගෙන යාම සඳහා සහ සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ එහි පරමාර්ථ මුදුන්පත් කර ගැනීම සඳහා ද, සංස්ථාව විසින් කලින් කල යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන් මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක

සංස්ථාවේ රීති.

විධිවිධානවලට අනනුකූල නොවන රීති සෑදීම නීත්‍යනුකූල වන්නේ ය. එකී රීති සෑදීමෙන් පසු එවැනිම රැස්වීමක දී එවැනිම ආකාරයකින් ඒවා වෙනස් කිරීම ඊට යමක් එකතු කිරීම ඒවා සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම කළ හැකි ය. :—

(2) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

සංස්ථාවේ අරමුදල.

**8.** (1) සංස්ථාවට එහිම අරමුදලක් තිබිය යුතු ය. ත්‍යාග, රික්තවරණ, පරිත්‍යාග, පැවරුම්, ග්‍රාහක මුදල්, දායක මුදල්, හෝ ගාස්තු භාරකාර මණ්ඩලය විසින් තීරණය කරනු ලබන පරිදි, එක් බැංකුවක හෝ බැංකු වැඩි ගණනාවක සංස්ථාවේ බැරට තැන්පත් කරනු ලැබිය යුතු ය.

(2) සංස්ථාවේ පරමාර්ථ ක්‍රියාත්මක කරගෙන යාමේ දී සංස්ථාව විසින් දරන ලද යම් වියදමක් පියවීමට අවශ්‍ය සියලු මුදල් සංස්ථාවේ අරමුදලින් ගෙවනු ලැබිය හැකි ය.

(3) සංස්ථාවේ මුදල් සහ දේපල කවර ස්ථානයකින් උපලබ්ධි වුවද, මෙහි දක්වා ඇති පරිදි, සංස්ථාවේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීම උදෙසා පමණක්ම යොදවනු ලැබිය යුතු අතර, ලාභාංශයක්, ප්‍රසාද දීමනාවක් හෝ අන් කවර හෝ ලාභයක් වශයෙන් සංස්ථාවේ මුදල් සහ දේපල වලින් කිසිම කොටසක් සංස්ථාවේ සාමාජිකයන්ට කෙලින්ම හෝ අන්‍යාකාරයෙන් ගෙවීම හෝ පැවරීම කරනු නොලැබිය යුතු ය.

එසේ වුවද, මේ වගන්තියේ විධිවිධාන මගින්-

(අ) සංස්ථාවේ යම් නිලධරයකු හෝ සේවකයකු විසින් සංස්ථාවට කරන ලද යම් සේවාවක් වෙනුවෙන් සද්භාවයෙන් යම් සාධාරණ සහ නිසි පාරිශ්‍රමිකයක් ඔහුට ගෙවීම ;

(ආ) සංස්ථාවේ යම් සාමාජිකයකු විසින් හෝ සංස්ථාවේ සාමාජිකයකු යම් සමාගමක කොටස්කරුවකු වන අවස්ථාවක ඒ සමාගම විසින් සංස්ථාවට කුලියට දෙන ලද ස්ථානයක් සඳහා සාධරණ නිසි කුලියක් ගෙවීම ; සහ

(ඈ) තම කටයුතු හෝ කාර්ය ඉටු කිරීමෙහි ලා හෝ සංස්ථාවේ පරමාර්ථ නංවාලීමෙ හි ලා සංස්ථාවේ යම් සාමාජිකයකු නිලධරයකු හෝ සේවකයකු විසින් භාරකාර සභාව කලින් ලබා ගන්නා ලද අනුමැතිය ඇති ව දරන ලද යුක්තිසහගත හා නිසි වියදම් ආපසු ගෙවීම පියවීම.

සංස්ථාවේ ගිණුම් හා විගණනය.

**9.** (1) සංස්ථාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(2) සංස්ථාව විසින් එහි ආදායම හා වියදම, වත්කම් සහ බැරකම් සහ සංස්ථාවේ වෙනත් සියලු ගණුදෙනු පිළිබඳ නිසි ගිණුම් තබා ගැනීමට කටයුතු සැලැස්විය යුතු ය.

(3) සංස්ථාවේ ගිණුම් සභාව තීරණය කරන පරිදි සුදුසුකම් ලත් විගනකවරයකු විසින් විගණනය කරනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තියේ ''සුදුසුකම්ලත් විගණකවරයා'' යන්නෙන් :—

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද, ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද තැනැත්තෙක් ; හෝ

(ආ) ගණකාධිකාරී ආයතනයක එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු ව වන්නා වූ ද, ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියේ යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද, එවැනි වරලත් ගණකාධිකාරී ආයතනයක්,

අදහස් වේ.

අභිධාන පාවිච්චි කිරීමේ සුදුසුකම්.

**10.** (1) ''අල් ආලීම්'' ලෙස මෙම විද්‍යාලයෙන් සමත් වන සෑම සිසුවෙකුටම ''ෆත්තාහි'' යන අභිධානය ලබා ගැනීමේ සහ භාවිතා කිරීමේ ද තම නාමයට පසුව පාවිච්චි කිරීමේ ද හිමිකම ඇත්තේ ය.

(2) ඉහත සඳහන් පරිදි හැර යට කී අභිධානයක් හෝ යෙදුමක් කිසිදු කාර්යයක් සඳහා වුව ද කිසිදු තැනැත්තකු විසින් පාවිච්චි නොකළ යුතු ය.

*සාමාජිකයන්ගේ වගකීම සීමා කිරීම.*

**11.** සංස්ථාවේ කිසිම සාමාජිකයකු ඔහුගෙන් සංස්ථාවට අය විය යුතු වාර්ෂික දායක මුදල් ප්‍රමාණය ඉක්මවන යම් මුදලක් සංස්ථාවේ ණය සහ බැරකම් නිදහස් කිරීමේ කාර්යය සඳහා හෝ වෙනත් යම් කාර්යයක් සඳහා ගෙවීමට යටත් නොවි යුතු ය.

*විදුහල විසින් සහ විදුහලට ගෙවිය යුතු මුදල්.*

**12.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයෙහි විදුහලේ පැවැති සියලු ණය සහ බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලැබූ සංස්ථාව විසින් ගෙවා නිදහස් කළ යුතු අතර, එදිනට විදුහලට ගෙවිය යුතු ග්‍රාහක මුදල් සහ දායක මුදල් මේ පනතේ කාර්ය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

*සංස්ථාව විසින් චංචල සහ නිශ්චල දේපළ දැරිය හැකි බව.*

**13.** යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, තෑගි කිරීමක්, අන්තිම කැමති පත්‍රයකින් දේපල බැහැර කිරීමක් ප්‍රකාර හෝ වෙනත් ආකාරයකින් සංස්ථාව සතුවන යම් චංචල හෝ නිශ්චල දේපලක් ගැනීමට සහ දැරීමට නීතියෙන් සංස්ථාවට බලය හා හැකියාව ඇති අතර, එවැනි සියලු දේපල සංස්ථාවේ තත්කාලීනව බලපවත්නා රීතිවලට යටත්ව, මේ පනතේ කාර්ය සඳහා ඒ දේපල විකිණීමේ, උකස් කිරීමේ, බදුදීමේ, හුවමාරු කිරීමේ හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමේ පූර්ණ බලය ඇතිව, මේ කාර්ය සඳහා සංස්ථා, විසින් දැරිය යුතු ය.

*සංස්ථාවේ මුද්‍රාව.*

**14.** ලේකම්වරයා හෝ සභාව විසින් යථා පරිදි බලය දෙනු ලැබූ සභාවේ සාමාජිකයකු හා සභාවේ තවත් සාමාජිකයකු ඉදිරිපිට දී හැර සංස්ථාවේ මුද්‍රාව කවර වුව ද සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් ඔවුන් විසින් ඒ සාධන පත්‍රයෙහි තම නම අත්සන් කළ යුතු ය. තව ද, එම අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු විසින් කරනු ලැබූ අත්සනකට පරිබාරහිර විය යුතු ය.

*සාමාජික නාමලේඛනය.*

**15.** (1) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී කමිටුවේ සාමාජිකයකු වූ සෑම තැනැත්තකුගේ ම සහ ඉන් පසුව සංස්ථාවේ සාමාජිකයකු වශයෙන් යථා පරිදි ඇතුළත් කරගනු ලබන සෑම තැනැත්තකුගේ ම නම ඇතුළත් කළ යුතු සාමාජික නාම ලේඛනයක් පවත්වාගෙන යාමට මණ්ඩලය විසින් කටයුතු කළ යුතු ය.

(2) ලේඛනයේ පහත සඳහන් විස්තර ඇතුළත් විය යුතු ය :—

(අ) සංස්ථාවේ එක් එක් සාමාජිකයාගේ, නම, ලිපිනය සහ රැකියාව ;

(ආ) යම් සාමාජිකයකුගේ නම ලේඛනයේ සටහන් කරනු ලැබූ දිනය ;

(ඇ) යම් තැනැත්තකු සාමාජිකයකු වී සිටීම අවසන් වූ දිනය ;

විසුරුවා හැරීමේ දී ඉතිරිවන දේපල.

**16**. සංස්ථාව විසුරුවා හැරීමේ දී, එහි සියලු ණය සහ බැරකම් ගෙවා සමථයට පත් කිරීමෙන් පසු කවර හෝ යම් දේපලක් ඉතිරි වුවහොත්, ඒ දේපල සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදා දෙනු නොලැබිය යුතු අතර, සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද ස්වකීය රීති අනුව යම් ආදායමක් හෝ දේපලක් ස්වකීය සාමාජිකයන් අතර බෙදා දීම රීති මගින් තහනම් කර ඇත්තා වූ ද වෙනත් ආයතනයකට හෝ ආයතනවලට ඒ දේපල දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය. එම ආයතනය හෝ ආයතන කවරේ ද යන්න සංස්ථාව විසුරුවා හැරීමේ දී හෝ ඊට පෙර, සංස්ථාවේ සභාව විසින් තීරණය කළ යුතු ය.

ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**17.** මේ පනතෙහි සඳහන් තැනැත්තන් හා ඔවුන් මගින් ඔවුන්ගෙන් හෝ ඔවුන් යටතේ හිමිකම්පාන්නන් හැර ශ්‍රී ලංකා ජනරජයේ යම් රාජ්‍ය මණ්ඩලයක, සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තකුගේ අයිතිවාසිකම්වලට මේ පනතේ අඩංගු කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවන්නේ ය.

සද්භාවයෙන් කරන ලද ක්‍රියා වගකීමෙන් නිදහස් කිරීම.

**18**. මේ පනතේ හෝ ඒ යටතේ පවරනු ලැබූ බලතල ප්‍රකාර නැතහොත් මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමෙහි ලා යම් තැනැත්තකු විසින් සද්භාවයෙන් කරනු ලැබූ හෝ කරන ලදැයි සලකනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් නඩු පවරනු ලැබීමට හෝ වෙනත් නීති කෘත්‍යයකට ඒ තැනැත්තා යටත් නොවන්නේ ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**19.** මෙම පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.